විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
வெளிநாட்டு வளங்கள் திணைக்களம்
Department of External Resources

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය (3 වැනි මහල), කොළඹ 00100, ශ්‍රී ලංකාව
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
செயலகம் (3 ஆம் மாடி), கொழும்பு 00100, இலங்கை
Ministry of Finance, Planning and Economic Development
The Secretariat (3rd Floor), Colombo 00100, Sri Lanka

**Website**: www.erd.gov.lk **e-mail:** info@erd.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | ER/AB/FN/63.Vol.i | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 18.08.2026 |

**මාධ්‍ය නිවේදනය**

**වෙළඳ, ආයෝජන සහ කර්මාන්ත සංවර්ධන වැඩසටහන - උපවැඩසටහන 1 ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 200ක මූල්‍ය සහාය ලබා ගැනීම**

ශ්‍රී ලංකා රජය විසින් **වෙළඳ, ආයෝජන සහ කර්මාන්ත සංවර්ධන වැඩසටහන - උපවැඩසටහන 1** ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 200ක ප්‍රතිපත්ති පාදක ණය (Policy-Based Lending) පහසුකමක් ලබා ගැනීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා රජය විසින් **ආසියානු සංවර්ධන බැංකුව (ADB)** සමඟ සාකච්ඡා පවත්වන ලදී.

මෙම වැඩසටහන 2025 ජාතික ප්‍රතිපත්ති රාමුව සමඟ අනුකූල වන අතර, ඔරොත්තුදෙන, සැමදෙන ඇතුලත් සහ තිරසාර ආර්ථිකයක් ගොඩනැගීම එහි අරමුණ වේ. තවද, වෙළඳාම හා ආයෝජන රජයේ ප්‍රධාන ප්‍රමුඛතා වන අතර, ඒවා 2026-2028 කාලය සඳහා වූ ප්‍රධාන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘතිවල ද පිළිබිඹු වේ.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන අභියෝගවලට වැඩසටහන්මය ප්‍රවේශයක් තුළින් විසඳුම් ලබාදීම සඳහා වෙළඳ, ආයෝජන හා කර්මාන්ත සංවර්ධන වැඩසටහන සැලසුම් කරනු ලැබීය. මෙම වැඩසටහන උපවැඩසටහන් දෙකකින් සමන්විත වේ. එනම්, ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 200ක මූල්‍ය පහසුකම් සහිත උපවැඩසටහන 1 සහ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 100ක සංකේතාත්මක මූල්‍ය පහසුකම් සහිත උපවැඩසටහන 2 වශයෙනි. උපවැඩසටහන 2 , 2028 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

පවතින මැදපෙරදිග අර්බුදය සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත කම්පන හේතුවෙන් උද්ගත වී ඇති වැඩි වෙමින් පවතින අවිනිශ්චිත ආර්ථික තත්ත්වය මධ්‍යයේ, මෙම ප්‍රතිපත්තිමය ණය පහසුකම ශ්‍රී ලංකා රජයට සාමාන්‍ය අයවැය සහය හරහා කාලෝචිත සහ අත්‍යවශ්‍ය මූල්‍ය සහායක් සපයයි. මෙම සන්දර්භය තුළ, ආසියානු සංවර්ධන බැංකුව වෙළඳ, ආයෝජන හා කර්මාන්ත සංවර්ධන වැඩසටහන - උපවැඩසටහන 1 යටතේ අමතර වශයෙන් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 100ක පරිපූරක මූල්‍ය පහසුකමක් ලබාදීමට එකඟ වී ඇත. ඒ අනුව, මුලින් එකඟ වූ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 100ක ණය මුදල ලෙස ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 200 දක්වා වැඩි කර ඇත.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මෙම වැඩසටහනෙහි විධායක ආයතනය ලෙස කටයුතු කරයි

ඒ අනුව, අදාළ ණය ගිවිසුම් සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා සහ

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | 94-11-2484693 | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 94-11-2484500<br>94-11-2484600 | ෆැක්ස් අංකය<br>தொலை நகல்<br>Fax | 94-11-2447633<br>94-11-2387153 |

ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් ශ්‍රී ලංකා නේවාසික අධ්‍යක්ෂිකා ෂැනන් කව්ලින් මහත්මිය විසින් 2026 අගෝස්තු 18 වන දින කොළඹ පිහිටි මහා භාණ්ඩාගාරයේ දී අත්සන් තබන ලදී.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
2026 අගෝස්තු 18